# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## 2016 ජනවාරි මස 14 වන දින

## II වන කොටස

## අතිරේකය

**(2016. 01. 18 දින නිකුත් කරන ලදී)**


# ගණේගම ශ්‍රී ඉන්දසාර ධර්මායතන සංරක්ෂණ සභාව (සංස්ථාගත කිරීමේ)

(පෞද්ගලික මන්ත්‍රීවරයකුගේ පනත් කෙටුම්පතකි)

**ගණේගම ශ්‍රී ඉන්දසාර ධර්මායතන සංරක්ෂණ සභාව සංස්ථාගත කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.**

ගාල්ල දිස්ත්‍රික් පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු මොහාන් ප්‍රියදර්ශන ද සිල්වා මහතා විසින් පාර්ලිමේන්තුවේ දී ඉදිරිපත් කිරීම පිණිසයි.


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක.

මිළ : රු. 8.00 යි. තැපැල් ගාස්තුව : රු. 10.00 යි.

# ගණේගම ශ්‍රී ඉන්දසාර ධර්මායතන සංරක්ෂණ සභාව (සංස්ථාගත කිරීමේ)

## ගණේගම ශ්‍රී ඉන්දසාර ධර්මායතන සංරක්ෂණ සභාව සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

පූර්විකාව.

"ගණේගම ශ්‍රී ඉන්දසාර ධර්මායතනය සංරක්ෂණ සභාව" යනුවෙන් හඳුන්වනු ලබන හා සඳහන් කරනු ලබන සභාවක් එකී සභාවේ සාමාජිකයන් විසින් එකඟ වූ රීති අනුව, අදාළ සියළු පරමාර්ථ සහ කරුණු ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමේ හා ඉටුකරගෙන යාමේ කාර්යය සඳහා ශ්‍රී ලංකාවේ බද්දේගම ගණේගම මෙතෙක් කල් පිහිටුවා තිබූ හෙයින් ද:

එකී සභාව පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ හා කරුණු සඳහා ද ඒ පරමාර්ථ හා කරුණු එකී සභාව විසින් මේ දක්වා සාර්ථක ලෙස ක්‍රියාත්මක කර සහ ඉටුකර ඇති හෙයින් සහ සංස්ථාගත කරනු ලැබීමට ඉල්ලුම් කර ඇති හෙයින් ද, එකී ඉල්ලීමට ඉඩ දීම මහජන යහපත පිණිස වන හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

**1.** මේ පනත 2016 අංක දරන "ගණේගම ශ්‍රී ඉන්දසාර ධර්මායතනය සංරක්ෂණ සභාව" (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. — ලුහුඬු නාමය.

**2.** මෙම පනත ක්‍රියාත්මක වන දින සිට සහ ඉන්පසු (මෙහි මින් මතු "සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන) එකී ගණේගම ශ්‍රී ඉන්දසාර ධර්මායතන සංරක්ෂණ සභාවේ තත් කාලයේ සිටින නිලධාරී මණ්ඩලය, විධායක මණ්ඩලය සහ උපදේශක මණ්ඩලය ද එකී ගණේගම ශ්‍රී ඉන්දසාර ධර්මායතන සංරක්ෂණ සභාවේ සාමාජිකයන්ට දැනට සිටින තැනැත්තන් හෝ මෙයින් සංස්ථාපනය කෙරෙන (මෙහි මින්මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කෙරෙන) සංස්ථාවට මින්මතු ඇතුළත් කරගනු ලබන සාමාජිකයන් "ගණේගම ශ්‍රී ඉන්දසාර ධර්මායතන සංරක්ෂණ සභාව" යන අභිදානය සහ නාමය යටතේ අඛන්ඩ පැවැත්මක් සහිත සංස්ථාවක් විය යුතු අතර, පොදු මුද්‍රාවක් තබා ගැනීමේ පාවිච්චි කිරීමේ හා සංස්ථාවේ අභිමතය පරිදි එය වෙනස් කිරීමේ පූර්ණ බලය හා අධිකාරය එයට ඇත්තේ ය. තව ද එකී නාමයෙන් ඒ සංස්ථාව විසින් ද, එයට විරුද්ධව ද සියළු අධිකරණයන් හි නඩු පවරනු ලැබිය හැකිය. — ගණේගම ශ්‍රී ඉන්දසාර ධර්මායතන සංරක්ෂණ සභාව සංස්ථාගත කිරීම.

සංස්ථාවේ පොදු පරමාර්ථ.

**3.** සංස්ථාව සංස්ථාපනය කරනු ලබන්නේ යම් පොදු පරමාර්ථ සඳහා ද ඒ පොදු පරමාර්ථ පහත සඳහන් පරිදි විය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ:—

(අ) පෞරාණික ශාසනික සම්ප්‍රදායානුකූලව සාමණේර භික්ෂූන් වහන්සේලා පුහුණු කිරීමේ මධ්‍යස්ථානයක් ආරම්භ කිරීම හා පවත්වාගෙන යාම;

(ආ) බුද්ධ ධර්මය පිළිබඳ පර්යේෂණ පවැත්වීම සඳහා මධ්‍යස්ථාන ඇරඹීම, පාලනය හා නඩත්තු කිරීම;

(ඇ) බුද්ධ ධර්මය හා බෞද්ධ සංස්කෘතිය ප්‍රචාරය කිරීම හා ආරක්ෂා කිරීම ; සහ

(ඈ) ගණේගම ශ්‍රී ඉන්දසාර ධර්මායතනය හා එයට අනුබද්ධ ආයතන වැඩි දියුණු කිරීම සහ සාමාජිකයන්ගේ හා පොදු මහජනයාගේ සාමාජීය හා සංස්කෘතික දියුණුව සඳහා අවශ්‍ය විධිවිධාන සැලැස්වීම යනාදියයි.

විධායක කාරක සභාව.

**4.** (1) සංස්ථාවේ කටයුතු තත්කාලයෙහි බලපවත්නා සංස්ථාවේ රීතිවලින් විධිවිධාන සලස්වා ඇති පරිදි ඒ රීතිවලට අනුකූලව තෝරා පත් කරගනු ලබන සාමාජිකයින් සංඛ්‍යාවකගෙන් සමන්විත විධායක කාරක සභාවක් විසින් ඒ රීතිවලට යටත්ව පාලනය කළ යුතු ය.

(2) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ පැවති සභාවේ ධුර දැරූ කාරක සභාව සංස්ථාවේ ප්‍රථම විධායක කාරක සභාව වන්නේ ය.

සංස්ථාවේ රීති.

**5.** (1) සාමාජිකයන් ඇතුළත් කරගැනීම අස්වීම හෝ අස්කිරීම සඳහා ද, සංස්ථාවේ විධායක කාරක සභාවේ නිලධරයන්ගේ, නියෝජිතයන්ගේ හා සේවකයන්ගේ කාර්යය ඉටුකිරීම සඳහා ද, නිලධරයන් තෝරා පත්කර ගැනීම සඳහා ද, සංස්ථාවේ කටයුතු කරගෙන යාමේ කාර්ය පටිපාටිය සම්බන්ධයෙන් ද, සාමාන්‍යයෙන් සංස්ථාවේ කටයුතු පරිපාලනය කිරීම හා එහි පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීම සඳහා ද, සංස්ථාව විසින් කලින් කල මහා සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගේ තුනෙන් දෙකක ඡන්දයෙන් මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනුකූල නොවන රීති සෑදීම නීත්‍යානුකූල වන්නේ ය.

(2) සංස්ථාවේ තත්කාලයේ බලපවත්නා හෝ මින් පසු සම්මත කරනු ලබන හෝ කිසිම රීතියක් සංස්ථාවේ මහාසභා රැස්වීමක දී

ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකක ඡන්දයෙන් විනා වෙනස් කිරීම, ඒවාට යමක් එකතු කිරීම, ඒවා සංශෝධනය කිරීම හෝ පරිච්ඡින්න කිරීම නොකරනු ලැබිය යුතු ය.

(3) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භවන අවස්ථාවේදී සභාවේ බලපැවැත්වූ රීති මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනුකූල නොවනතාක් දුරට මේ පනත යටතේ සාදනු ලැබූ සංස්ථාවේ රීති ලෙස සළකනු ලැබිය යුතු ය.

(4) සංස්ථාවේ සියලුම සාමාජිකයන් තත් කාලයේ බලපවත්නා සංස්ථාවේ රීතිවලට යටත් විය යුතු ය.

සභාව විසින් ගෙවිය යුතු සහ සභාවට අයවිය යුතු ණය.

**6.** මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුවම වූ දිනයේ දී පැවති සභාවේ සියලුම ණය සහ බැරකම් සංස්ථාව විසින් ගෙවා නිදහස් කළ යුතු අතර, සභාවට අයවිය යුතු සියලු ණය හෝ ගෙවිය යුතු දායක මුදල් සහ සාමාජික මුදල් මේ පනතේ කාර්ය සඳහා සංස්ථාවට ගෙවිය යුතුය.

සංස්ථාවේ සාමාන්‍ය බලතල.

**7.** මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව බැංකු ගිණුමක් විවෘත කිරීමේ, පවත්වාගෙන යැමේ සහ වැසීමේ ද, ඇප ඇතිව හෝ නැතිව හෝ මුදල් ණයට ගැනීමේ හෝ ලබා ගැනීමේ ද, ප්‍රදානය සහ පරිත්‍යාග භාර ගැනීම සහ එකතු කිරීමේ ද , ස්වකීය අරමුදල් ආයෝජනය කිරීමේ ද, සංස්ථාවේ පරමාර්ථ ක්‍රියාත්මක කර ගැනීමේ කාර්ය සඳහා අවශ්‍ය සේවක පිරිස් සේවයට බඳවාගැනීමේ, නියුක්ත කරගැනීමේ සහ සේවයෙන් පහකිරීමේ ද බලය ඇතුළුව, සංස්ථාවේ පරමාර්ථ හෝ ඒ පරමාර්ථ අතුරින් යම් පරමාර්ථයක් ප්‍රවර්ධනය කිරීම හෝ නංවාලීම සඳහා අවශ්‍ය හෝ යෝග්‍ය කවර ආකාරයක හෝ සියලු ක්‍රියා කිරීමේ ද, කරුණු ඉටු කිරීමේ ද, දේවල් ක්‍රියාවේ යෙදීමේ ද බලය සංස්ථාවට ඇත්තේ ය.

සංස්ථාව විසින් චංචල හා නිශ්චල දේපල දැරියහැකි බව.

**8.** යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, ත්‍යාගයක්,නැතහොත් අන්තිම කැමති පත්‍රයකින් වූ දේපල බැහැර කිරීමක් මගින් හෝ වෙනත් යම් ආකාරයකින් හෝ සංස්ථාව සතු කරනු ලබන යම් නිශ්චල හෝ චංචල දේපලක් භාර ගැනීමට හා දැරීමට සංස්ථාවට නීතියෙන් බලය ඇති අතර, එවැනි සියලු දේපල සංස්ථාව විසින් මේ පනතේ

කාර්ය සඳහා දරනු ලැබිය යුතු ය. තව ද සංස්ථාවේ තත් කාලයේ බලපවත්නා රීතිවලට යටත් ව ඒ දේපල විකිණීමේ, උකස් කිරීමේ, බද්දට දීමේ, හුවමාරු කිරීමේ, හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීමේ පූර්ණ බලය සංස්ථාව සතු වන්නේ ය.

සංස්ථාවේ මුද්‍රාව තැබිය යුතු ආකාරය.

**9.** සංස්ථාවේ ලේකම්වරයා සහ ගණේගම ශ්‍රී ඉන්දසාර ධර්මායතනාධ්‍යක්ෂ නම් යන දෙදෙනා ඉදිරිපිට දී විනා සංස්ථාවේ මුද්‍රාව කවර හෝ සාධන පත්‍රයකට නොතැබිය යුතු ය. තමන් පැමිණ සිටීමේ ලකුණක් වශයෙන් ඔවුන් විසින් එකී සාධන පත්‍රයෙහි තම නම අත්සන් කරනු ලැබිය යුතු අතර, එකී අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකු හෝ අත්සන් කිරීමට පරිබාහිර විය යුතු ය.

සංස්ථාවේ මූලස්ථානය.

**10.** ගාලු ගඟබඩ පත්තුවේ ගණේගම දකුණේ පිහිටි ගලමා කන්දගොඩ වත්ත නැමති දැනට එකී ධර්මායතනය සතු ඉඩම සහ එහි ඇති ගොඩනැගිලි සංස්ථාවේ මූලස්ථානය විය යුතු අතර, එය සංස්ථාව සතු දේපලක් ලෙස සැළකිය යුතු ය.

සාමාජිකත්වය හා සාමාජික මුදල්.

**11.** (1) මෙම සංස්ථාවේ පරමාර්ථයන්ට එකඟ වන්නා වූ උපසපන් භික්ෂූන් වහන්සේලා ද, ශාසනාලයැති ශ්‍රද්ධා සම්පන්න ගෘහස්ථ බෞද්ධයෝ ද මෙම සංස්ථාවේ සාමාජිකත්වය දැරීමට සුදුස්සෝ වෙති.

(2) ධර්මායතනයට වාර්ෂික දානය පිරිනමන දායකවරු පූර්ණ සාමාජික අයිතිවාසිකම් සහිත සාමාජිකයෝ වෙති.

(3) සංස්ථාවට එකවර රුපියල් දහසක් (රු 1000.00) ක් හෝ ඊට වැඩි මුදලක් ගෙවන්නෝ එහි යාවජීව සාමාජිකයෝ වෙති.

(4) යාවජීව සාමාජිකයන් හා ධර්මායතනයේ දායකවරු හැර රුපියල් සියයක (රු. 100.00) වාර්ෂික සාමාජික මුදලක් ගෙවන වෙනත් අය ද සාමාජිකත්වය ලැබීමට සුදුස්සෝ වෙති.

(5) බද්දේගම ප්‍රාදේශීය මහලේකම්, බද්දේගම ප්‍රාදේශීය සභාපති තුමා, බද්දේගම ප්‍රධාන වෛද්‍ය නිළධාරීතුමා, බද්දේගම පොලිස් ස්ථානාධිපතිතුමා, ගණේගම දකුණ ග්‍රාම නිළධාරීතුමා නිළ සාමාජිකත්වය ලබන්නෝ වෙති.

උපදේශක මණ්ඩලය.

**12.** (1) මෙම සංස්ථාවේ උපදේශක මණ්ඩලය ධර්මායතනාධ්‍යක්ෂ හා පරිවේනාධිපති දෙනමට අමතරව පත්කර ගන්නා ධර්ම විනයධර ශික්ෂාකාමී මහතෙරුන් වහන්සේලා තුන් නමක ගෙන් සහ උගත් වැඩිහිටි සැදැහැවත් බෞද්ධ පින්වතුන් දෙදෙනකුගෙන් ද සමන්විත විය යුතු ය.

(2) ඉහත සඳහන් උපදේශක මණ්ඩලයට ඇතුළත් ධර්මායතනාධ්‍යක්ෂ හා පරිවේනාධිපති දෙනම හැර සෙසු සාමාජිකයන් මහා සභා රැස්වීමක දී සාමාජිකයන්ගේ වැඩි ඡන්දයෙන් තෝරා පත්කර ගත යුතු ය.

අධ්‍යක්ෂ ධුරය සහ ඊට අයත් බලතල.

**13.** (1) මෙම පනත සම්මත වන අවස්ථාවේ මෙම ධර්මායතනයේ අධ්‍යක්ෂ ධුරය දරන්නා වූ ශාස්ත්‍රවේදී පූජ්‍ය කෙරදේවල වජිරඤාණ ස්වාමීන් වහන්සේ ප්‍රථම අධ්‍යක්ෂවරයා වන්නේය. මෙම සංස්ථාව මගින් පවත්වනු ලබන ගණේගම ශ්‍රී ඉන්දසාර ධර්මායතනයේ සහ මින්මතු ආරම්භ කරනු ලබන ආයතන ආදීය වෙත්නම් ඒවායේත් අභ්‍යන්තර පාලකවරයා අධ්‍යක්ෂවරයා විය යුතු ය.

(2) උන්වහන්සේගෙන් පසුව පුරප්පාඩු වන අධ්‍යක්ෂ ධුරයට උන්වහන්සේගේ පැවිදි පරපුරට අයත් ධර්ම විනයධර ශික්ෂාකාමී වහන්සේ නමක් තෝරා පත්කර ගත යුතු ය.

(3) එකී පූජ්‍ය කෙරදේවල වජිරඤාණ ස්වාමීන් වහනසේ පැවිදි පරපුරට අයත් අවශ්‍ය සුදුසුකම් ඇති භික්ෂූන් වහන්සේ නමක් නැති අවස්ථාවක පමණක් පරම්පරා සම්බන්ධයෙන් තොරව උපරිම සුදුසුකම් ඇති භික්ෂූන් වහන්සේ නමක් අධ්‍යක්ෂ ධුරය සඳහා බැහැරින් තෝරා පත්කර ගතහැකිය.

(4) සිසුන් ඇතුළත් කර ගැනීම, බැහැර කිරීම, පරිවේනාධිපති හා ගුරුවරුන් පත්කිරීම, අස්කිරීම, සේවකයන් බඳවාගැනීම, ඉවත් කිරීම, විනය පාලනය, ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලාගේ සුව පහසුව සැලැස්වීම, පුහුණුව පිළිබඳ කටයුතු සහ අධ්‍යාපනය පිළිබඳ කාර්ය සංවිධානය කිරීම යනාදිය අධ්‍යක්ෂවරයා සතු බලතල හා වගකීම් වන්නේ ය.

සංස්ථාව සතු අරමුදල්.

**14.** (1) වියහියදම් බැහැර කිරීමෙන් අනතුරුව ශේෂ වන්නා වූ මෙම සංස්ථව සතු යම්කිසි මුදලක් වේ නම් "ගණේගම ශ්‍රී ඉන්දසාර ධර්මායතන සංරක්ෂණ අරමුදල" යනුවෙන් නම් කර ඇති අංක 1534 දරන බද්දේගම මහජන බැංකු ශාඛාවේ ජංගම ගිණුමේ තැන්පත් කළ යුතු ය.

(2) බැංකු ගණුදෙනුවල දී අධ්‍යක්ෂ හා භාණ්ඩාගාරික හෝ ලේකම් යන දෙදෙනාගෙන් එක් අයකු චෙක්පත්වල සහ අවශ්‍ය ලියවිලිවල අත්සන් තැබිය යුතු ය.

ජනරජයේ හා අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

**15.** මෙම පනතෙහි සඳහන් තැනැත්තන් හා ඔවුන් මගින් ඔවුන් කෙරෙන් නොහොත් ඔවුන් යටතේ හිමිකම් පාන්නන් හැර ජනරජයේ යම් රාජ්‍ය මණ්ඩලයක, සංස්ථාවක හෝ වෙනත් යම් තැනැත්තකුගේ අයිතිවාසිකම්වලට මේ පනතේ අඩංගු කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවන්නේ ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**16.** මෙම පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.